# කෘෂි තාක්ෂණ තොරතුරු

කෘෂි තාක්ෂණ තොරතුරු කඩිනමින් ගොවි ජනතාව අතරට ලබා දීමේ අත්වැලකි

*කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ ප්‍රකාශනයකි*

**තාක්ෂණික පත්‍රිකා අංක 6 - 2014 ජූනි**

## පරිසර හිතකාමී කෘෂිකර්මය !

පරිසර හිතකාමී කෘෂිකර්මාන්තය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නොයෙකුත් විධිවිධාන සහ පරිසර හිතකාමී පලිබෝධ පාලනයට විවිධ වූ තාක්ෂණයන් ගොවි ජනතාව වෙත හඳුන්වා දී ඇත. එනම් ඒකාබද්ධ පලිබෝධ පාලනය, ඒකාබද්ධ වල් මර්දනය සහ ඒකාබද්ධ පැළෑටි පෝෂක කළමණාකරනය යන තාක්ෂණයන් මීට ඉහත හඳුන්වා දුන්නද ඒ සඳහා ගොවීන්ගේ නැඹුරු වීම බොහෝ මන්දගාමීව සිදුවිය. නමුත් අද වනවිට පරිසර හිතකාමී ලෙස වගා කිරීම සහ වසවිෂ වලින් තොර ආහාර භාවිතයට නැඹුරුවීමේ ප්‍රවණතාවයක් ඇත.

### පසේ සාරවත් බව රැකීමට ඒකාබද්ධ ශාක පෝෂණ ක්‍රියාවලිය (IPNS)

අකාබනික හා කාබනික ශාක පෝෂක ප්‍රභවයන් භාවිතා කරමින් ඒවායේ අඩංගු ශාක පෝෂක මඟින් පසෙහි සාරවත් බව තිරසාර ලෙස පවත්වා ගනිමින් බෝග නිෂ්පාදනය කරනු පිණිස, සමාජයීය වශයෙන් පිළිගනු ලබන හා ආර්ථිකව උචිත, සලකා බලනු ලබන පාරිසරික තත්ත්වයන්ට ගැළපෙන ශාක පෝෂණ ක්‍රමයක් ලෙස ඒකාබද්ධ ශාක පෝෂණ ක්‍රියාවලිය අර්ථ දැක්විය හැකිය.

ඒකාබද්ධ ශාක පෝෂක කළමණාකරනය

- පසෙන් බෝග විසින් කෙරෙන ශාක පෝෂක ප්‍රමාණය පසට එකතු කරමින් ඒවා අතර සමතුලිතතාවයක් පවත්වා ගැනීමේ උත්සාහයක් අයිපීඑන්එස් හි ඇත. මෙහි ආරම්භක පියවර වන්නේ පසෙහි කොපමණ ශාක පෝෂක තිබේදැයි විමසා බැලීමයි.
- පාංශු විශ්ලේෂණය මඟින් පසෙන් ලබා ගැනීමට හැකි පෝෂක ප්‍රමාණයන්, යම්කිසි සීමාකාරී තත්ත්වයන් ඇතොත් ඒවාත් ඇගයීමට පුළුවන. ලබා ගැනීමේ හැකියාව අඩුවී ඇති පෝෂක දැනගත හැකිය. එහෙයින් එය ආරම්භයේදීම කළ යුතුය.
- පෝෂක ඉවත්වීම ඇගයීමේදී තනි බෝගයක් සහිත පද්ධතියක් ද බහුබෝග පද්ධතියක් ද කොපමණ කාලයක් පුරා වගා කොරේද ආදී කරුණු සැලකිල්ලට ගත යුතුය.
- යෙදිය යුතු ඛනිජමය පොහොර ප්‍රමාණයන් තීරණය කෙරෙන්නේ පාංශු පරීක්ෂණයේදී P හා K සම්බන්ධයෙන් ලැබුණ අගයන් මතය.
- කාබනික පොහොර ප්‍රමාණයන් එකතු කිරීමේදී එමඟින් ලැබෙන සුළු හා ක්ෂුද්‍ර ශාක පෝෂක අවශ්‍යතා පිළිබඳව ඇගයිය යුතුය.
- බෝගයේ ඉල්ලුම මත පමණක් නයිට්‍රජන් පොහොර යෙදිය යුතුය. එසේ නොමැතිව මුළු ක්ෂේත්‍රයටම පොදු නිර්දේශයක් අනුගමනය නොකළ යුතුය.
- පොහොර භාවිත කාර්යක්ෂමතාව අඩු කෙරෙන නියඟ තත්ත්වය,මතුපිට පාංශු ඛාදනය හා දුර්වල ජලවහනය ආදී කරුණු මඟහරවා ගත යුතුය.
- නිවැරදි පොහොර භාවිතයක් සහතික කරනු වස් මූලික යෙදුමටත් කාබනික හා රසායනික යන පොහොර දෙවර්ගයම භාවිතා කළ යුතුය.
- බෝග පද්ධතියේ පාංශු පෝෂක ප්‍රභවය ප්‍රතිපූරණය කෙරෙන ලෙස බෝග අවශේෂ ප්‍රතිචක්‍රීකරණය කළ යුතුය.
- බෝග පද්ධතියට රනිල බෝග ඇතුළත් කළහොත් ජෛවීය නයිට්‍රජන් තිරවීමේ වාසි ඇති වේ.
- සෑම බෝගයකටම වාගේම නිර්දේශිත පාංශු පෝෂණ පැකේජයන් හඳුන්වා දී ඇත.

*(තොරතුරු - ශාක පෝෂණ ක්‍රියාවලිය ප්‍රකාශනය ඇසුරින් සකස් කර ඇත.)*

# ඒකාබද්ධ පළිබෝධ පාලනය

පළිබෝධ පාලනයට වඩා කාර්යක්ෂම වඩා ලාභදායී හා පරිසර හිතකාමී ක්‍රමවේදයක් ලෙස ඒකාබද්ධ පළිබෝධ පාලනය හඳුන්වාදෙනු ලබයි. මෙහිදී ගොවීන් ආරක්‍ෂක පියවරක් ලෙස පළිබෝධනාශක යෙදීම වෙනුවට පළිබෝධ ආර්ථික හානිදායි මට්ටමට වර්ධනය වූ පසු පමණක් පළිබෝධනාශක භාවිතයට ගොවීන්ව යොමු කරන අතර එයින් යොදන පළිබෝධනාශක වාර ගණන අඩු කිරීමද අරමුණක් වේ. එවිට හිතකර සතුන් මඟින් පළිබෝධ ගහනය අස්වැන්නට හානිකර නොවන මට්ටමකට පවත්වා ගත හැකිවනවා මෙන්ම වගාවේ ජෛව විවිධත්වයද සමතුලිතව පවත්වා ගැනීමට උපකාරී වේ.

ඒකාබද්ධ පළිබෝධ පාලන ක්‍රමවේදය අනුගමනය කිරීමේදී, පහත සඳහන් කටයුතු කළයුතු වේ.

- නිරෝගී වගාවක් පවත්වා ගෙන යාම
- හිතකර සතුන් ආරක්‍ෂා කිරීම
- පළිබෝධ සුපරීක්‍ෂාව
- නිවැරදි තීරණ ගැනීම

නීරෝගී වගාවක් සඳහා

- කන්නයට වගා කිරීම
- යාය එකට වගා කිරීම
- ප්‍රතිරෝධී ප්‍රභේද භාවිතය
- වල් මර්දනය
- ජල පාලනය
- සමබර පොහොර භාවිතය

### හිතකර සතුන් ආරක්‍ෂා කිරීම

ක්ෂේත්‍රයේ වායව හා ජලජ පරිසරයේ සිටින හිතකර සතුන් හඳුනා ගැනීම හා ආරක්‍ෂා කිරීම පිළිබඳ අවබෝධයක් ලබා දේ.

- නියරේතැනින් තැන කුඩා පිදුරු ගොඩවල් තැබීම
- නියරේ රනිල බෝග වගාව
- නියරේ වල් ඉතා කෙටි වනසේ ගසා දැමීම
- බිත්තර පරපෝෂිතයන් ආරක්‍ෂා කර ගැනීම
- අනවශ්‍ය ලෙස පළිබෝධනාශක යෙදීමෙන් වැළකීම

### ගොවීන් සඳහා ඒකාබද්ධ පළිබෝධ පාලන වැඩසටහන

ඒකාබද්ධ පළිබෝධ පාලන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ගොවීන්ට ඒ පිළිබඳ දැනුම හා හුරුව ලබාදිය යුතු වේ. එම නිසා පුහුණු කටයුතු ක්ෂේත්‍රයේදී පවත්වන අතර ගොවියා විසින්ම ඉගෙන ගැනීම සිදුවේ. මෙම වැඩසටහන කන්නයක් පුරා පැවැත්විය යුතුය.

ඉහත සඳහන් කටයුතු ගොවීන් සමග ක්ෂේත්‍රයේදී සිදු කරන බැවින් පහසුවෙන් පළිබෝධ හඳුනා ගෙන නිවැරදි ලෙස තීරණ ගැනීමට ගොවියා යොමු කිරීමක් සිදු වේ. එමඟින් අනවශ්‍ය පළිබෝධනාශක යෙදීම වළක්වා ගතහැකි අතරම නිෂ්පාදන වියදම අඩු කරගත හැක. එමෙන්ම නිරෝගී වගාවක් පවත්වා ගෙන යාහැකි ආකාරය හා හිතකර සතුන් ආරක්‍ෂා කරගත හැකි ආකාරය පිළිබඳ ගොවියාටම අත්දැකීමෙන් ඉගෙන ගැනීමට හැකියාව ලැබේ.

*(තොරතුරු හා වැඩි විස්තර සඳහා - නියෝජ්‍ය අධ්‍යක්‍ෂ, පැළෑටි සංරක්‍ෂණ සේවය, ගන්නොරුව, පේරාදෙණිය)*

# වී වගාවේ ඒකාබද්ධ වල් පැළෑටි පාලනය

වර්තමානයේදී වී වගාවේ වල් පාලනය ගැන විමර්ශණය කරන විට එය රසායනික වල් පාලන ප්‍රමුඛ කර ගත් ක්‍රියාදාමයක් බව දක්නට ලැබේ. එය මගහරවා ගනිමින්, වල් පාලනයට වැයවන වියදම් පහත හෙලමින්, සාර්ථක වල් පාලනයක් සඳහා ඒකාබද්ධ වල් පාලනය භාවිතා කළ යුතු වේ.

**1. වල් පැළෑටි පිළිබඳව මූලික අවබෝධයක් තිබීම**

වල් පාලනය සිදු කරනවිට ලියද්දේ බහුලව දක්නට ලැබෙන වල් වර්ග පිළිබඳ අවබෝධය තිබීම වැදගත් වේ.

**2. මූලික බිම් සකස් කිරීම**

වල් පාලනය කිරීමේ ආරම්භක පියවර වේ. නිවැරදි ආකාරයට මූලික බිම් සකස් කිරීම සිදු කළයුතු අතර, ඒ සඳහා සුදුසු උපකරණ (යකඩ නගුල, මෝල්බෝඩ් නගුල, තැටි නගුල) යොදා ගැනීමට සැලකිලිමත් වියයුතුය. මෙහිදී පස් පිඩැල්ලක් මගින් අනෙක් පස් පිඩැල්ල වැසී යායුතු අතර මතුපිටට විවෘතව පැවතිය යුත්තේ වල් රහිත පස් කැටිය පමණි. මෙහිදී පැවතුණු වල් පසට යට වී මියයන අතර විවෘත වූ පස් කැට වල පැවති වල් බීජ ප්‍රරෝහණය වීමට පටන් ගනී.

**3. ද්විතීයික බිම් සකස් කිරීම**

පෙරළන ලද පස් කැටිති වල වල් බීජ ප්‍රරෝහණය වීමට ප්‍රමාණවත් කාලයක් ලබා දීමෙන් (දින 10-12 පමණ) පසුව ද්විතියික බිම් සකස් කිරීම කළයුතුය. මේ අන්දමින් බිම් සකස් කිරීම මගින් මතුපිට පසේ පළමු අඟල් 10 ක පමණ ගැඹුරට නිදන්ව පැවති වල් බීජ වලින් සැලකියයුතු ප්‍රමාණයක් විනාශ කළ හැක.

**4. තෘතීයික බිම් සකස් කිරීම**

මෙමඟින් ලියැදි වල ලොකු පස් කැටිති කඩා බිඳ දමා සියුම් තත්ත්වයට පත් කර ලියැද්ද මට්ටම් කිරීම සිදුකෙරේ. ලියැද්ද නිසි පරිදි මට්ටම් කර තිබීම ජල පාලනය තුලින් කාර්යක්‍ෂම වල් පාලනය සිදුකිරීමට මහෝපකාරී වනු ඇත.

**5. ජලයෙන් යට කිරීම**

වාරිමාර්ග පහසුකම් සහිත ඉඩම් වල පෙරලූ පස් පිඩැලි වලින් 3/4 පමණ ජලයෙන් යට වන පරිදි වතුර බැඳීමෙන් පහසුවෙන් වල් පැළ විනාශ කර ගැනීමට හැකිවේ.

**6. ආගන්තුක වල් පැළෑටි මර්දනය කිරීම**

කුඹුරු ලියද්දට පිටතින් වල් බීජ පැමිණෙන මාර්ග අවබෝධ කරගෙන ඒවා ඇහිරීමද සිදුකළ යුතුය.

- බිත්තර වී වලින් පැමිණෙන වල් බීජ මර්දනය සඳහා ගුණාත්මක බිත්තර වී භාවිතය
- ඇල මාර්ග වල බිත්තර වී දියේ දැමීමෙන් වැළකීම
- අස්වනු නෙළන යන්ත්‍ර වැනි උපකරණ මගින් වල් බීජ පැමිණිය හැකි බැවින් භාවිතයට පෙර පිරිසිදු කිරීම

**7. මැද කන්න මාශ බෝග වගාව**

අතරමැද කන්නයේ මාශ බෝග වගාවෙන් ලියද්දේ වල් ඇතිවීම පාලනය කළහැක. මෙම මාශ බෝග අස්වනු නෙළීමෙන් පසු කොළ පොහොරක් ලෙසට නැවත පසට එකතු කිරීම මගින් වල් බීජ ප්‍රරෝහණය වීම දුර්වල කරනු ලැබේ. එසේම අතරමැදි කන්නයේ වගා නොකළ කුඹුරු සඳහා ග්ලිරිසිඩියා කොළ අතු යෙදීමෙන් ද මෙම වාසිය අත්කර ගත හැක.

**8. ඒකාකාර සරු වගාවක් පවත්වා ගැනීම**

වගාව පිහිටුවීමේදී ගුණාත්මයෙන් ඉහළ බීජ වී භාවිතය මගින් ඒකාකාර හා ඉක්මන් වර්ධනයක් සහිත පැළපතක් ලබා ගැනීමට හැකිවනු ඇත. ගොයම ඉක්මනින් වර්ධනය වී බිම ආවරණය කිරීම සිදු කළහොත් වල් මතු වීම වලක්වා ගත හැක. ඒ සඳහා නිර්දේශිත රසායනික සහ කාබනික පොහොර යෙදිය යුතුය.

**9. යාන්ත්‍රීකරණය**

ගොයම් පේලි අතර පරතරය පවත්වාගෙන පැළ සිටුවීමෙන් හෝ බීජ වැපිරීමෙන් (බීජ වප්කර භාවිතයෙන්) යාන්ත්‍රික වල් මර්දනය පහසුවනු ඇත. යාන්ත්‍රික වල් මර්දනයේදී යොදාගන්නා වීඩර් මගින් සුළුවෙන් පස පෙරළීමකට බඳුන් වන බැවින් මූල මණ්ඩලය අවට වාතනය නිසියාකාරව සිදුවීමෙන් ගසේ වර්ධනය කඩිනම් වේ.

**10. පැළ සිටුවීම සඳහා පැළ විසි කිරීමේ තාක්‍ෂණය භාවිතා කිරීම (පැරෂුට් ක්‍රමය)**

මීට අමතරව පැළ විසි කිරීමේ තාක්‍ෂණය යොදා ගැනීම මඟින් ද වල් පාලනය සාර්ථක කරගත හැක. හොඳින් වර්ධනය වූ පැළයක් ක්ෂේත්‍රයේ සිටුවන නිසා එය ඉතා කඩිනමින් වර්ධනය වී වැඩි පඳුරු ප්‍රමාණයක් ඇති කරනු ලැබේ. මෙම ක්‍රමය උපයෝගී කර ගැනීමෙන් රසායනික වල් මර්දනය සහමුලින්ම නතර කිරීමට හැකිවනු ඇත. තැනින් තැන ඇතිවන වල් අතින් ගලවා ඉවත් කළහැක.

*(තොරතුරු හා වැඩි විස්තර සඳහා - ජේ.ආර්.සුදසිංහ මයා, සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ වී)*

## ශ්‍රී ලංකාව තුළ පලිබෝධනාශක භාවිතය

පලිබෝධනාශක පනතට අනුව ශ්‍රී ලංකාව තුළ පලිබෝධනාශක ගෙන්වීම, ඇසිරීම, බෙදා හැරීම හා භාවිතය දැඩි පාලනයට ලක් කර තිබේ. අනවසරයෙන් පලිබෝධනාශක මෙරටට ගෙන්වා බෙදා හැරිය නොහැක. පලිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය මගින් ඒ සඳහා බලපත්‍ර ලබා දෙන්නේ පර්යේෂණ ගණනාවක් සිදු කිරීම තුළිනි. පලිබෝධනාශක වල විෂ භාවය අනුව රතු, කහ නිල් සහ කොළ පැහැති වර්ණ දාරයන්ගෙන් යුක්තව වෙළඳපලට නිකුත් කරනු ලැබේ. රතු වර්ණ දාරය සහිත පලිබෝධනාශක මිනිසාට උග්‍ර විෂ කාණ්ඩයට අයත් වන අතර එවැනි පලිබෝධනාශක භාවිතය මේ වනවිට මෙරට තුළ තහනම් කර ඇත. එම කාණ්ඩයට අයත් පලිබෝධනාශක කිහිපයක් සීමිත භාවිතය යටතේ (උදාඃ ආනයන අපනයනයේදී ධූමායනය සඳහා මෙතයිල් බ්‍රෝමයිඩ්) අවසරලත් ආයතන වලට පමණක් භාවිතා කළ හැක. ඒවා විවෘත වෙළඳපලේදී මිලදී ගත නොහැකිය. ඒ අනුව උග්‍ර විෂ කාණ්ඩයට අයත් නොවන පලිබෝධනාශක පමණක් මෙරට භාවිතය සඳහා නිර්දේශ කර තිබේ. 1970 සිට 2012 දක්වා මෙරට තුළ භාවිතය තහනම් කර ඇති පලිබෝධනාශක සංඛ්‍යාව 29කි. 2013 වසරේ සිට පලිබෝධනාශක 4ක් වන කාබොෆියුරාන්, කාබරිල්, ක්ලෝපයිරිෆොස් හා ප්‍රොපනිල් ආනයනය තහනම් කර තිබේ. ඒ අනුව මේ වනවිට ශ්‍රී ලංකාව තුළ පලිබෝධනාශක වර්ග 33 ක් තහනම් කර තිබේ.

## පලිබෝධනාශක භාවිතය අවම කිරීමට පොලඹවනු ලැබේ

සෑම පලිබෝධනාශකයක්ම, එහි අඩංගු රසායනික ද්‍රව්‍ය කුමක්වුවද, මිනිසාට විෂ සහිත බැවින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පලිබෝධනාශක තෝරා ගැනීමේ සිට යෙදීම දක්වා විවිධ ආරක්ෂක උපක්‍රම හඳුන්වා දී තිබේ.

1. රසායනික නොවන විවිධ ක්‍රමද ඇතුලත් ඒකාබද්ධ පලිබෝධ පාලන පිළිවෙත් හඳුන්වා දී තිබේ. අත්‍යවශ්‍ය අවස්ථාවලදී පමණක් රසායනික පලිබෝධනාශක යෙදීම නිර්දේශ කරන අතර එහිදී ද රෝග හා කෘමි හානිය නිවැරදිව හඳුනාගනිමින් එයට අදාළව නිර්දේශ කර ඇති පලිබෝධනාශකය පමණක් නියමිත මාත්‍රාවට අනුව නිවැරදිව හා ආරක්ෂිතව යෙදීමටත්, යෙදීමෙන් පසු නිශ්චිත කාලසීමාවක් තුළ අස්වනු ලබා නොගැනීමටත් නිර්දේශ කර තිබේ.

2. පලිබෝධනාශක වල රසායනික සංඝටක පරීක්ෂාකර බැලීමට අවශ්‍ය උපකරණ පලිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ රසායනාගාරයට ඉතා මෑතකදී ලබාදී ඇති අතර එමගින් මෙරටට ගෙන්වන පලිබෝධනාශක වල අඩංගු බැර ලෝහ රසායනික පිළිබඳ පරීක්ෂා කර ඒ අනුව අවශ්‍ය පියවර ගනු ලැබේ. එපමණක් නොව වෙළඳපලට පැමිණෙන පලතුරු හා එළවළු වල අඩංගු පලිබෝධනාශක අවශේෂ පරීක්ෂා කිරීමේ කටයුතු ද ආරම්භ කෙරේ.

3. පලිබෝධනාශක භාවිතය පිළිබඳව විශේෂයෙන් පුහුණුවලත් පුද්ගලයින් පලිබෝධනාශක අලෙවිය සඳහා යෙදවීමට පියවර ගෙන තිබේ. ඒ අනුව පුහුණුවලත් "පලිබෝධනාශක අලෙවි හා තාක්ෂණ සහකරුවන්" සෑම පලිබෝධනාශක වෙළඳසැලකම සිටීම අනිවාර්ය කර ඇති අතර ඔවුන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. මෙමගින් පලිබෝධනාශක භාවිතය පිළිබඳ වැරදි තොරතුරු ගොවි ජනතාව වෙත යාම අවම වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එමෙන්ම දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරීන් විසින් පලිබෝධනාශක සිල්ලර හා තොග වෙළඳසැල්, හදිසි පරීක්ෂා කිරීම් ක්‍රියාත්මක කර අක්‍රමිකතා පිළිබඳව නීත්‍යානුකූලව කටයුතු කෙරේ.

4. අනවශ්‍ය ලෙස භාවිතයට පොලඹවන පලිබෝධනාශක දැන්වීම් පුවරු ඉවත් කිරීමට කටයුතු කර ඇති අතර තාක්ෂණ කමිටුවේ උපදෙස් මත සියලු පලිබෝධනාශක දැන්වීම් පලිබෝධ මර්දන ක්‍රියාවලියට අනුගතවන සේ ප්‍රචාරණය කිරීම සඳහා දැන්වීම් උපදේශන මාලාවක් නිකුත් කර ඇත.

5. දැනට සම්මත ක්‍රමවේදයක් නොමැතිව බොහෝ විට පරිසරයට මුදාහැරෙන පලිබෝධනාශක හිස් බඳුන් ප්‍රතිචක්‍රීකරණය සඳහා පලිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය පරිසර අමාත්‍යංශය සහ පෞද්ගලික අංශය සමඟ ඒකාබද්ධව ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කිරීම අරඹා ඇත.

6. පරිසරයට කෘමිනාශක එක් වීම අවම කිරීම සඳහා කෘමිනාශක ඉසින යන්ත්‍ර සහ නොසල ප්‍රමිතීන්ට යටත් කිරීමේ වැඩ පිළිවෙලක් හඳුන්වා දීම සඳහා සාකච්ඡා වෙමින් පවතී.

7. ලංකාවට ආනයනය කරන පලිබෝධනාශක වල ආසනික් ඇතුලු බැර ලෝහ වර්ග 9 ක් හා සයනයිඩ් රසායනිකය ඇති ප්‍රමාණයන් පරික්ෂා කරබලා එම ද්‍රව්‍ය තිබිය හැකි උපරිම ප්‍රමාණය ඉක්මවා නැති පලිබෝධනාශක පමණක් ගෙන ඒමට අවසර ලබාදීම. ක්ෂේත්‍රයෙන් පලිබෝධනාශක සාම්පල ගෙන පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය උපකරණ ලබාගෙන ඇති අතර මේ සඳහා නිලධාරීන් පුහුණු කිරීම මේ දින වල සිදු කරමින් පවතී. නුදුරේදීම ක්ෂේත්‍ර සාම්පල් විශ්ලේෂණ කටයුතු ආරම්භ කිරීමට නියමිතය.

*(තොරතුරු සහ වැඩි විස්තර සඳහා පලිබෝධනාශක රෙජිස්ට්‍රාර් - පලිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය, ගැටඹේ)*

සැකසුම: චාමරී නිලූෂි සිල්වා, කෘෂිකර්ම උපදේශක (සන්නිවේදන)
අධීක්ෂණය හා උපදෙස්: ඩබ්.ඒ.පී. සිසිර කුමාර, අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන)